**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

**<u>පුවත්පත් නිවේදනය</u>**

**මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමාගේ උතුරු සහ නැගෙනහිර සංචාරය**

අද දින ත්‍රිකුණාමලය නාවික සහ සමුද්‍රීය ඇකඩමියේ (NMA) පැවති උත්සවයකදී මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා ශ්‍රී ලංකා රුපියල් මිලියන 22ක් වටිනා පුහුණු ආධාර තොගයක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ නැගෙනහිර නාවික ප්‍රදේශය භාර අණදෙන නිලධාරීතුමාට භාර දුන්නේය.

ධාරිතාවයන් ගොඩනැගීමෙහිලා කලාපයේ නාවික හමුදාවන්ට සහය වීමට ඉන්දීය නාවික හමුදාව දක්වන කැපවීමට අනුව ශ්‍රී ලංකා නාවික හමුදාවට විවිධ පුහුණු අයිතම ලබා දීමට 2019 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකා සංචාරයක නිරත වූ ඉන්දීය නාවික හමුදා මාණ්ඩලික ප්‍රධානී අද්මිරාල් කරම්බිර් සිං මැතිතුමා පොරොන්දු විය. NMA විසින් පවත්වනු ලබන විශේෂ පාඨමාලා සඳහා සහය ලබා දීමට අවධානය යොමු කරමින් දේශීයව සංවර්ධනය කරන ලද වරුණාස්ත්‍ර අධිබර ශ්‍රී ලංකා නාවික හමුදා මොඩලයේ ටෝපිඩෝ, වැඩ කරන මොඩලයේ සැහැල්ලු බර ටෝපිඩෝ, දිය යට දුරකථන, ගෑස් ටර්බයින කට් මොඩලය, HMS ත්‍රිකුණාමලය මොඩලය සහ බාති උෂ්ණත්ව දර්ශකය 2020 වර්ෂයේදී ශ්‍රී ලංකාවට භාර දුන් අතර ඒවා ඉන්දීය නාවික හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ඉන්දියාවේ OEMහි සාමූහික ප්‍රයත්නයන් සමඟින් මෙහෙයවන ලදී.

පුහුණු ආධාර නිල වශයෙන් භාර දෙමින් මහ කොමසාරිස්තුමා සමස්ත ද්විපාර්ශවික සම්බන්ධතාවයේ අත්‍යන්ත කොටසක් ලෙස දෙරටෙහි නාවික හමුදාවන් අතර සමීප සබඳතාවයේ වැදගත්කම අවධාරණය කළේය. එතුමා  කින්ඩ්ල් ඉ-පොත් කියවන සහ තවත් පොත් නාවික සහ සමුද්‍රීය ඇකඩමියේ පුස්තකාලයට භාර දුන්නේය.

ඉන්දීය නාවික හමුදාව සහ ශ්‍රී ලංකා නාවික හමුදාව සැමවිටම මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන ගොස් ඇති අතර ඉන්දීය නාවික හමුදාවේ පුහුණු පහසුකම් රැසක්ම ශ්‍රී ලංකා නාවික හමුදාවට ලබා දී ඇත.

***

කොළඹ
2021 මාර්තු 14